## Abstract 06

# බුද්ධ ශාසනයේ අප්‍රකට ලක්ෂණ: පහාරාද සූත්‍රය ආශ්‍රයෙන් කෙරෙන විග්‍රහයක්

ඩබ්. ආර්. විසාකා මල්කාන්ති විජේරත්න,
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*wimansasamanalee@gmail.com*

බුද්ධ ශාසනයේ ස්වභාවය මහා සමුද්‍රයේ හැසිරීමට තුලනය කරන අපූරු සූත්‍රයක් ලෙස **අංගුත්තරනිකායේ** අට්ඨක නිපාතාගත **පහාරාද සූත්‍රය** හැඳින්විය හැකි ය. මෙම සූත්‍රයෙහි සාගරයෙහි පවතින ලක්ෂණ අටක් දක්වමින් ඒවා බුද්ධ ශාසනයේ භාවිතයට අදාළ කර ගැනේ. ඒවා මෙසේ ය. 1. මහාසමුද්‍රය අනුපිළිවෙළින් ගැඹුරු වී ගෙන යන්නාක් මෙන් බුදුසසුන ද ප්‍රතිපදාවක් වශයෙන් අනුක්‍රමයෙන් ගැඹුරු ය. 2. මහාසමුද්‍රයේ ජලය වෙරළ ඉක්මවා නො යන්නාක් මෙන් භික්ෂූහු ද බුදුසසුනේ විනය නීති ඉක්මවා නො යති. 3. මහාසමුද්‍රය අපවිත්‍ර ද්‍රව්‍ය හා එකතු නො වන්නාක් මෙන් බුදුසසුන ද අකුශලය හා එකතු නො වේ. 4. විවිධ ගංගා ජලය මහ මුහුදට ගිය පසු ‘මහාසමුද්‍ර ජලය’ ලෙස හඳුන්වන්නාක් මෙන් සියලු කුලවලින් පැවිදි වූවෝ ‘ශ්‍රමණ ශාක්‍යපුත්‍ර’ ලෙස හැඳින්වෙති. 5. කෙතරම් වැසි ගංගා ජලය එකතු වුව ද මහා සමුද්‍රයේ ජලය අඩු හෝ වැඩි හෝ වීමක් සිදු නො වන්නා සේ බුදුසසුනෙහි ද නිවනට පත් වූවන්ගේ අඩු වැඩි වීමක් හෝ සිදු නොවේ. 6. මහාසමුද්‍ර ජලයෙහි එක ම ලුණු රසයක් පවත්නාක් මෙන් බුදුසසුනෙහි ද පවතිනුයේ එක ම විමුක්ති රසය පමණකි. 7. මහාසමුද්‍රයෙහි ඉතා අගනා මාණික්‍ය පවතින්නාක් මෙන් බුදුසසුනෙහි ද ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය ආදී මාණික්‍ය පවතී. 8. සමුද්‍රයේ ක්‍රීඩා කරමින් මහා සත්ත්වයෝ සිටින්නාක් මෙන් බුදුසසුන්හි සෝවාන් ආදී මගපලවලට පත් වූවෝ වෙසෙති. මෙම කරුණු ආශ්‍රයෙන් බුදුසසුනේ සදාතනික ස්වභාවයන් කාල හා දේශ අභේදෝපචාරයෙන් සිදුවන බව හඳුනා ගැනීමට කෙරෙන ප්‍රයත්නයක් මෙම පර්යේෂණයෙන් සිදුවේ. **පුද්ගල අවභාවිතයන් ඇතත් බුද්ධශාසනයේ අපවිත්‍රත්වය, නිර්වාණ ප්‍රතිපදාවේ අකාලික බව, අධිගමලාභීන්ගේ පැවැත්ම** යනාදී කරුණු රාශියක් පිළිබඳව මෙමගින් අනාවරණය කර ගත හැකි වනු ඇති අතර මෙම හැදෑරීම ඉදිරි ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට මෙන් ම ඵලදායක චර්යාමය අත්හදා බැලීම් විෂයයෙහි ද උපස්තම්භක වනු ඇත.

**ප්‍රමුඛ පද :** අනුපූර්ව ප්‍රතිපදාව, පහාරාද සූත්‍රය, මාර්ගඵල, සමුද්‍රය, සාසනය